# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 01

## අන්තර්ජාතික වෙළඳාම

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# අන්තර්ජාතික වෙළඳාම අර්ථදැක්වීම

ලෝකේ කිසියම් රටක් තවත් රටක් හෝ රටවල් කිහිපයක් හෝ සමග හෝ භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීම විදේශ වෙළදාම හෙවත් අන්තර්ජාතික වෙළඳාම ලෙස හැඳින්වේ.

අපනයන වෙළඳාම හා ආනයන වෙළඳාම ලෙස අන්තර්ජාතික වෙළඳාම ප්‍රධාන කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය.

රටවල් අන්තර්ජාතික වෙළඳාමට සම්බන්ධ වන්නේ එමගින් වෙළඳාමට සම්බන්ධ වන රටවලට වාසි අත්වන හෙයිනි පහත දැක්වෙන්නේ එවැනි වාසි කිහිපයකි.

- අතිරික්ත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළෙඳපොළවල් සොයා ගත හැකි වීම.
- දේශීය වශයෙන් නිෂ්පාදනය කළ නොහැකි භාණ්ඩ පිටරටින් අඩු මිළට ගැනීමට හැකි වීම.
- ගුණාත්වයෙන් යුත් භාණ්ඩ අඩු මිලට පරිභෝජනය කිරීමට හැකි වීම.
- දියුණු තාක්ෂණය විදේශ රටවලින් ලබා ගැනීමට හැකිවීම.
- විදේශ ආයෝජන විදේශ ණය විදේශ ආධාර ලබා ගැනීමට හැකි වීම.
- ආර්ථික වර්ධනය වේගවත් කිරීමට හැකිවීම.
- අන්තර්ජාතික සහයෝගීතාවය වර්ධනය කර ගැනීමට හැකි වීම.

## අන්තර් ජාතික වෙළඳාම හටගැනීමට න්‍යායාත්මක පදනම

- නිරපේක්ෂ වාසි
- සාපේක්ෂ වාසි

**නිරපේක්ෂ වාසි යනු:**

කිසියම් රටක් කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු පිරිවැයකින් නැතහොත් වැඩි කාර්යක්ෂමතාවයකින් නිෂ්පාදනය කළ හැකි නම් එකී රටට භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා නිරපේක්ෂ වාසි පවතින බව ප්‍රකාශ කෙරේ. එසේ නොමැති නම් නිරපේක්ෂ අවාසි පවතින බව ප්‍රකාශ කෙරේ.

රටවල් තමන්ට නිරපේක්ෂ වාසි පවතින භාණ්ඩ විශේෂීකරණය (විශේෂ ප්‍රගුණනය) කොට විදේශයන්ට අලෙවිකර විදේශයන්ගෙන් තමන්ට නිපදවිය නොහැකි භාණ්ඩ ගෙන්වා ගැනීමට කටයුතු කරයි.

# නිරපේක්ෂ වාසි සංඛ්‍යාත්මක නිදසුන් මගින්:

- යෙදවුම් ප්‍රවේශය (පිරිවැය ආශ්‍රිත ගැටලු)
- නිමයුම් ප්‍රවේශය (ඵලදායිතාවය ආශ්‍රිත ගැටලු)

## යෙදවුම් ප්‍රවේශය (පිරිවැය ආශ්‍රිත ගැටලු)

මෙහි දී කිසියම් රටකට තවත් රටකට සාපේක්ෂව අඩු යෙදවුම් ප්‍රමාණයකින් භාණ්ඩ නිපදවීමට හැකියාවක් ඇත්නම් එම රටට නිරපේක්ෂ වාසි පවතින බව ප්‍රකාශ කෙරේ.

නිදසුන් - සහල් හා රෙදි ඒකකයක් නිපදවීම සඳහා ශ්‍රී ලංකාවට හා ඉන්දියාවට අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය පහත ලබා දී ඇත

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 2 | 3 |
| රෙදි | 4 | 1 |

කුෂාන් වීරහැන්නැදිගේ

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
| --- | --- | --- |
| සහල් | 2 | 3 |
| රෙදි | 4 | 1 |

ශ්‍රී ලංකාවට සහල් සඳහා නිරපේක්ෂ වාසි ඇත

ඉන්දියාවට රෙදි සඳහා නිරපේක්ෂ වාසි ඇත

යෙදවුම් ප්‍රවේශය (පිරිවැය ආශ්‍රිත ගැටලු) දී නිරපේක්ෂ වාසි සොයන පදනම වන්නේ අඩුම යෙදවුම් ප්‍රමාණය හෙවත් අඩුම පිරිවැය.

# නිමයුම් ප්‍රවේශය (ඵලදායිතාවය ආශ්‍රිත ගැටලු)

මෙහි දී කිසියම් රටකට තවත් රටකට සාපේක්ෂව වැඩි නිමයුම් ප්‍රමාණයකින් භාණ්ඩ නිපදවීමට හැකියාවක් ඇත්නම් එම රටට නිරපේක්ෂ වාසි පවතින බව ප්‍රකාශ කෙරේ.

නිදසුන් - ශ්‍රම පැයක දී ශ්‍රී ලංකාව හා ඉන්දියාව නිපද වන සහල් හා රෙදි ඒකක ප්‍රමාණය පහත ලබා දී ඇත

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 12 | 13 |
| රෙදි | 14 | 11 |

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
| --- | --- | --- |
| සහල් | 12 | 13 |
| රෙදි | 14 | 11 |

ශ්‍රී ලංකාවට රෙදි නිරපේක්ෂ වාසි ඇත

ඉන්දියාවට සහල් සඳහා නිරපේක්ෂ වාසි ඇත

නිමයුම් ප්‍රවේශය (ඵලදායිතා ආශ්‍රිත ගැටලු) දී නිරපේක්ෂ වාසි සොයන පදනම වන්නේ වැඩිම ප්‍රමාණය හෙවත් වැඩිම ඵලදායිතාවය.

# නිරපේක්ෂ වාසි හටගැනීමට හේතු

- දේශගුණය සුවිශේෂීත්වය
- සම්පත් උරුමය
- සාධක සුලභතාවය
- ඓතිහාසික හේතු

නිරපේක්ෂ වාසි න්‍යායේ දුර්වලතාවය එනම් නිරපේක්ෂ වාසිය භාණ්ඩ වර්ග දෙක සඳහාම එක් රටකට පැවතුනහොත් වෙළඳාමක් හට ගැනීමට ඉඩක් නොමැත එම නිසා සාපේක්ෂ වාසි න්‍යාය බිහිවිය

# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 02

### අන්තර්ජාතික වෙළඳාම

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

## සාපේක්ෂ වාසි යනු:

කිසියම් රටක් කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් නිෂ්පාදනය කළ හැකි නම් එකී රටට භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ වාසි පවතින බව ප්‍රකාශ කෙරේ.

එසේ නොමැති නම් සාපේක්ෂ අවාසි පවතින බව ප්‍රකාශ කෙරේ.

රටවල් තමන්ට සාපේක්ෂ වාසි පවතින භාණ්ඩ විශේෂීකරණය (විශේෂ ප්‍රගුණනය) කොට විදේශයන්ට අලෙවිකර විදේශයන්ගෙන් තමන්ට නිපදවිය නොහැකි භාණ්ඩ ගෙන්වා ගැනීමට කටයුතු කරයි.

## සාපේක්ෂ වාසි න්‍යායේ උපකල්පන

- පූර්ණ සාධක සංචලතාවය
- ස්ථාවර පරිමාණුකූල ඵල
- නිෂ්පාදනය හෝ පාරිභෝජනය බාහිරතා හට නොගන්නා බව
- ප්‍රවාහන පිරිවැය සැලකිල්ලට නොගැනීම

## සාපේක්ෂ වාසි හටගැනීමට හේතු

- **සම්පත් සම්භාරයේ වෙනස්වීම**
- **ගුණාත්මක තත්ත්වය**
- **රුචියේ වෙනස්වීම්**
- **පරිමානුකූල පිරිමැසුම්**
- **නිෂ්පාදන ප්‍රභේදනය**
- **රාජ්‍ය ප්‍රතිපත්ති**
- **උද්ධමනය**
- **ස්ථානගතවීම**

## සාපේක්ෂ වාසි සංඛ්‍යාත්මක නිදසුන් මගින්:

- යෙදවුම් ප්‍රවේශය (පිරිවැය ආශ්‍රිත ගැටලු)
- නිමයුම් ප්‍රවේශය (ඵලදායිතාවය ආශ්‍රිත ගැටලු)

### යෙදවුම් ප්‍රවේශය (පිරිවැය ආශ්‍රිත ගැටලු)

මෙහිදී පහත ආකාරයට අවස්ථික පිරිවැය සෙවිය යුතුයි

X ආවස්ථික පිරිවැය $= \frac{X}{Y}$

Y ආවස්ථික පිරිවැය $= \frac{Y}{X}$

නිදසුන් - සහල් හා රෙදි ඒකකයක් නිපදවීම සඳහා ශ්‍රී ලංකාවට හා ඉන්දියාවට අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය පහත ලබා දී ඇත

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 2 | 3 |
| රෙදි | 4 | 1 |

කුෂාන් වීරහැන්නැදිගේ

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 2 | 3 |
| රෙදි | 4 | 1 |

සාපේක්ෂ වාසි සෙවීමට පහත ආකාරයට අවස්ථික පිරිවැය සෙවිය යුතුයි

ශ්‍රී ලංකාව

සහල් ආවස්ථික පිරිවැය = $\frac{\text{සහල්}}{\text{රෙදි}}$ → $\frac{2}{4}$ 0.5

රෙදි ආවස්ථික පිරිවැය = $\frac{\text{රෙදි}}{\text{සහල්}}$ → $\frac{4}{2}$ 2

සහල් සඳහා ශ්‍රී ලංකාවට සාපේක්ෂ වාසි ඇත

ඉන්දියාව

සහල් ආවස්ථික පිරිවැය = $\frac{\text{සහල්}}{\text{රෙදි}}$ → $\frac{3}{1}$ 3

රෙදි ආවස්ථික පිරිවැය = $\frac{\text{රෙදි}}{\text{සහල්}}$ → $\frac{1}{3}$ 0.33

රෙදි සඳහා ඉන්දියාවට සාපේක්ෂ වාසි ඇත

# නිමයුම් ප්‍රවේශය (ඵලදායිතාවය ආශ්‍රිත ගැටලු)

මෙහිදී පහත ආකාරයට අවස්ථික පිරිවැය සෙවිය යුතුයි

X ආවස්ථික පිරිවැය $= \frac{Y}{X}$

Y ආවස්ථික පිරිවැය $= \frac{X}{Y}$

නිදසුන් - ශ්‍රම පැයක දී ශ්‍රී ලංකාව හා ඉන්දියාව නිපද වන සහල් හා රෙදි ඒකක ප්‍රමාණය පහත ලබා දී ඇත

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 12 | 36 |
| රෙදි | 24 | 12 |

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 12 | 36 |
| රෙදි | 24 | 12 |

සාපේක්ෂ වාසි සෙවීමට පහත ආකාරයට අවස්ථික පිරිවැය සෙවිය යුතුයි

ශ්‍රී ලංකාව

සහල් ආවස්ථික පිරිවැය $= \frac{\text{රෙදි}}{\text{සහල්}}$ → $\frac{24}{12}$ 2

රෙදි ආවස්ථික පිරිවැය $= \frac{\text{සහල්}}{\text{රෙදි}}$ → $\frac{12}{24}$ 0.5

රෙදි සඳහා ශ්‍රී ලංකාවට සාපේක්ෂ වාසි ඇත

ඉන්දියාව

සහල් ආවස්ථික පිරිවැය $= \frac{\text{රෙදි}}{\text{සහල්}}$ → $\frac{12}{36}$ 0.33

රෙදි ආවස්ථික පිරිවැය $= \frac{\text{සහල්}}{\text{රෙදි}}$ → $\frac{36}{12}$ 3

සහල් සඳහා ඉන්දියාවට සාපේක්ෂ වාසි ඇත

## ස්ථිතික වාසි යනු

නිෂ්පාදන හා පාරිභෝජන මුල් කරගෙන රටකට ස්වභාවිකව උරුම වී ඇති වාසියකි.

## ස්ථිතික වාසි සඳහා හේතු

- සම්පත් සම්භාරය වෙනස්වීම්
- රටවල් අතර අභිරුචියේ වෙනස්වීම්
- නිෂ්පාදන පරිමානුකූල පිරිමැසුම් වල විශාල බව

## ගතික වාසි යනු

තාක්ෂණයේ දියුණුව භාණ්ඩ ප්‍රභේදනය රාජ්‍ය ප්‍රතිපත්ති වෙළඳ ගිවිසුම් ආදිය මඟින් රටවල් නිර්මාණය කරගනු ලබන තත්වයක් නිසා හටගන්නා වාසියකි.

## ගතික වාසි සඳහා හේතු

- තාක්ෂණයේ දියුණුව
- භාණ්ඩ ප්‍රභේදනය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- වෙළඳ ගිවිසුම්

## තරගකාරීත්වය වාසි යනු

කිසියම් භාණ්ඩයක් පාරිභෝගිකයන් වෙත සැපයීමේදී සෙසු තරගකරුවන් වඩා වැඩි වටිනාකමක් පාරිභෝගිකයන් වෙත ලබාදිය හැකි වීමයි.

## තරගකාරීත්වය වාසි සඳහා හේතු

- පර්යේෂණ සංවර්ධනයෙන් විශාල හැකියාවක් තිබීම.
- බුද්ධිමය දේපළ හිමිකාරිත්වය.
- බෙදාහැරීමේ ජාලය පිළිබඳ සුවිශේෂී හිමිකමක් තිබීම.

# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 03

## අන්තර්ජාතික වෙළඳාම

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

## භුවමාරු අනුපාතයන්

එක් එක් රට සාපේක්ෂ වාසි ඇති භාණ්ඩ නිෂ්පාදනය විශේෂීකරණය කොට අතිරික්ත නිෂ්පාදන රටවල් අතර භුවමාරු කර ගනු ලබන්නේ කිසියම් අනුපාතිකයට යටත්වය අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක භුවමාරු අනුපාතය ගණනය කිරීමේදී ඊට අදාළ වන භුවමාරු අනුපාත ප්‍රධාන ස්වරූප දෙකකි .

1. අභ්‍යන්තරික භුවමාරු අනුපාතය

2. බාහිර භුවමාරු අනුපාතය

# අභ්‍යන්තරික හුවමාරු අනුපාතය

විදේශ වෙළඳාම පෙර ඒ ඒ රටවල් අතර භාණ්ඩ හුවමාරු අනුපාතය අභ්‍යන්තර වූ හුවමරු අනුපාතයයි.

නිදසුන් - ශ්‍රම පැයක දී ශ්‍රී ලංකාව හා ඉන්දියාව නිපද වන සහල් හා රෙදි ඒකක ප්‍රමාණය පහත ලබා දී ඇත

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 12 | 36 |
| රෙදි | 24 | 12 |

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 12 | 36 |
| රෙදි | 24 | 12 |

අභ්‍යන්තරික හුවමාරු අනුපාතය සෙවීමට පහත ආකාරයට අවස්ථික පිරිවැය සෙවිය යුතුයි

ශ්‍රී ලංකාව

| සහල් | රෙදි |
|---|---|
| 12 | 24 |
| 1 | 2 |
| 0.5 | 1 |

සහල් 1 රෙදි 2

රෙදි 1 සහල් 0.5

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරික හුවමාරු අනුපාතය

ඉන්දියාව

| සහල් | රෙදි |
|---|---|
| 36 | 12 |
| 1 | 0.33 |
| 3 | 1 |

සහල් 1 රෙදි 0.33

රෙදි 1 සහල් 3

ඉන්දියාවේ අභ්‍යන්තරික හුවමාරු අනුපාතය

## බාහිර හුවමාරු අනුපාතය

බාහිර හුවමාරු අනුපාතය යනු වෙළඳාමට සම්බන්ධ වීම නිසා දෙරට අතර භාණ්ඩ හුවමාරු වන අනුපාතයයි .

| ශ්‍රී ලංකාව | | ඉන්දියාව | |
|---|---|---|---|
| සහල් 1 | රෙදි 2 | සහල් 1 | රෙදි 0.33 |
| රෙදි 1 | සහල් 0.5 | රෙදි 1 | සහල් 3 |

ඉන්දියාව සහල් 1කට රෙදි 0.33 වැඩි සහ 2 අඩු

ශ්‍රී ලංකාව රෙදි 1කට සහල් 0.5 වැඩි සහ 3 අඩු

# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 04


## අන්තර්ජාතික වෙළඳාම


**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ගොඩනැගීම

නිදසුන් - ප්‍රංශය හා ජර්මනිය සතුව ශ්‍රම පැය 100 බැගින් පවතින අතර ඒම ශ්‍රම පැය 100 යම යොදා නිපද විය හැකි ඔරලෝසු හෝ රූපවාහිනි පහත දක්වා ඇත.

| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය |
|---|---|---|
| ඔරලෝසු(ඒකක) | 500 | 2000 |
| රූපවාහිනි (ඒකක) | 1000 | 1000 |



# 1:1 අනුපාතය යටතේ රටවල් අනතර්ජාතික වෙළදාමට සම්බන්ධවේ නම් පරිභෝජන හැකියා මායිම් වක්‍රයක් ගොඩණැගීම

## පියවර 1 සාපේක්ෂ වාසි සේවීම

**ප්‍රංශය**

ඔරලෝසු ආවස්ථික පිරිවැය = $\frac{\text{රූපවාහිණී}}{\text{ඔරලෝසු}}$ $\frac{1000}{500}$ 2

රූපවාහාණී ආවස්ථික පිරිවැය = $\frac{\text{ඔරලෝසු}}{\text{රූපවාහිණී}}$ $\frac{500}{1000}$ 0.5

රූපවාහිණී සඳහා ප්‍රංශයට සාපේක්ෂ වාසි ඇත

**ජර්මනිය**

ඔරලෝසු ආවස්ථික පිරිවැය = $\frac{\text{රූපවාහිණී}}{\text{ඔරලෝසු}}$ $\frac{1000}{2000}$ 0.5

රූපවාහාණී ආවස්ථික පිරිවැය = $\frac{\text{ඔරලෝසු}}{\text{රූපවාහිණී}}$ $\frac{2000}{1000}$ 2

ඔරලෝසු සඳහා ජර්මනියට සාපේක්ෂ වාසි ඇත

# පියවර 2 අදාල රටවල් ඔවුන්ට සාපේක්ෂ වාසි සහිත භාණ්ඩ විශේෂ ප්‍රගුණනය කිරීම


රූපවාහිණී සඳහා ප්‍රංශයට සාපේක්ෂ වාසි ඇත


ඔරලෝසු සඳහා ජර්මනියට සාපේක්ෂ වාසි ඇත

| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය |
|---|---|---|
| ඔරලෝසු(ඒකක) | 0 | 2000 |
| රූපවාහිනි (ඒකක) | 1000 | 0 |

# පියවර 3 - 1:1 අනුපාතය යටතේ භාණ්ඩ හුවමාරු කිරීම

| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය |
|---|---|---|
| ඔරලෝසු(ඒකක) | 0 | ~~2000~~ 1600 |
| රූපවාහිනි (ඒකක) | 600 ~~1000~~ | 0 |



# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 05

## අන්තර්ජාතික වෙළඳාම

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# ආරක්ෂණය

දේශීය වෙළඳපොළට විදේශීය භාණ්ඩ ඇතුළු වීම සීමා කරන හෝ වලක්වන ඕනෑම ක්‍රියාපිළිවෙතක් ආරක්ෂණය නමින් හැදින්වේ.

නිදහසට බාධා කරන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග ප්‍රධාන කොටස් දෙකකි.

1. තීරුබදු ආරක්ෂණය
2. තීරු බදු නොවන ආරක්ෂණය

# තීරුබදු ආරක්ෂණය යනු

- අපනයන හා ආනයන මත බදු පැනවීමයි.
- ආනයන තීරු බදු පැනවීමෙන් එම භාණ්ඩ මිලදී ගන්නා දේශීය පාරිභෝගිකයන්ට වැඩි මිලක් ගෙවීමට සිදුවන නිසා ආනයන අධෛර්යමත් වේ.
- තීරු බද්දක් පැනවීමේ ප්‍රධාන අරමුණක් වනුයේ දේශීය නිෂ්පාදකයන් විදේශ තරගයෙන් ආරක්ෂා කිරීමයි.
- ආනයනික භාණ්ඩ සඳහා තීරු බදු පැනවූ විට දේශීය භාණ්ඩ සඳහා පාරිභෝගිකයන් යොමුවන බැවින් දේශීය භාණ්ඩ නිෂ්පාදනය ප්‍රසාරණය වේ

# නාමික ආරක්ෂණ අනුපාතිකය

- තීරු බදු වැඩි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයේ මිලට වඩා ආනයනය කරනු ලබන භාණ්ඩයේ මිල ඉහළ යාමේ ප්‍රතිශතය තුළින් දේශීය නිෂ්පාදනයට ලැබෙන ආරක්ෂණය නාමික ආරක්ෂණ අනුපාතිකය වශයෙන් හැඳින්වේ.

- මෙමගින් දේශීය භාණ්ඩ වෙත ලැබෙන සැබෑ ආරක්ෂණය ප්‍රමාණය නිවැරදිව පිළිබිඹු නොවේ.

- එයට හේතුව නම් නාමික ආරක්ෂණ අනුපාතිකයන් ගණනය කරන්නේ ආනයනික අවසාන භාණ්ඩයට අයකරන තීරුබදු පදනම් කරගෙනය නමුත් ආනයනය කර යෙදවුම් සඳහා තීරු බදු අය කිරීම මෙහි සැලකිල්ලට නොගනී.

# සඵල ආරක්ෂණ අනුපාතිකය

- ආනයන තීරු බද්දක් පැනවීම මගින් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණයයි.
- එය පහත ආකාරයට ගණනය කරයි.

$$ERP = \frac{V1 - V0}{V0} \times 100$$

**ERP** - සඵල ආරක්ෂණ අනුපාතිකය

**V1** - තීරු බදු පැනවූ විට දේශීය නිෂ්පාදකයාගේ එකතු කළ අගය

**V0** - නිර්බාධ වෙළදාම යටතේ දේශීය නිෂ්පාදනයේ එකතු කළ අගය

උදා - පාවහන් නිෂ්පාදන ආයතනයක පාවහන් යුගලක මිල රු.5000 කී.ආනයනික පාවහන් යුගලක මිලද රු.5000 කී. පාවහන් නිපදවීමට යොදා ගන්නා අමුද්‍රව්‍ය පිරිවැය රු.3000 ද වේ. ආනයනික පාවහන් යුගල මත සියයට 10% ක තීරු බද්දක් අය කරයි නම් සඵල ආරක්ෂණ අනුපාතිකය ගණනය කරන්න.

V1 V0

V1 = තීරු බදු පසු නිමයුම - තීරු බදු පෙර යෙදවුම

$$5000 \times \frac{110}{100} = 5500$$

5500 - 3000 = 2500

V0 = තීරු බදු පෙර නිමයුම - තීරු බදු පෙර යෙදවුම

5000 - 3000 = 2000

$$ERP = \frac{V1 - V0}{V0} \times 100$$

$$ERP = \frac{2500 - 2000}{2000} \times 100$$

25%

ආනයනික යෙදවුම් මත 5% තීරු බද්දක් අය කරන්නේ නම් නැවත සඵල ආරක්ෂණ අනුපාතිකය ගණනය කරන්න.

V1 = තීරු බදු පසු නිමයුම - තීරු බදු පසු යෙදවුම

5500 - 3150 = 2350

$$5000 \times \frac{110}{100} = 5500$$

$$3000 \times \frac{105}{100} = 3150$$

V0 = තීරු බදු පෙර නිමයුම - තීරු බදු පෙර යෙදවුම

5000 - 3000 = 2000

$$ERP = \frac{V1 - V0}{V0} \times 100$$

$$ERP = \frac{2350 - 2000}{2000} \times 100$$

**17.5%**

# සඵල ආරක්ෂණ අනුපාතිකය ඉහළ අගයක් ගැනීමට හේතු

- අවසාන නිෂ්පාදිත මත පනවනු ලබන නාමික තීරුබදු අනුපාතිකය ඉහළ අගයක් ගැනීම.

- ආනයනික යෙදවුම් මත පනවනු ලබන තීරුබදු අනුපාතිකය පහළ අගයක් ගැනීම.

- භාණ්ඩයේ වටිනාකම තුල ආනයනයකර යෙදවුම් ප්‍රතිශතය පහළ අගයක් ගැනීම.

# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 06

## අන්තර්ජාතික වෙළඳාම

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග

- සලාක කිරීම හෙවත් කෝටා නියම කිරීම
- දේශීය නිෂ්පාදකයන්ට සහනාධාර හෝ දිරිගැන්වීම් ලබා දීම
- ප්‍රපාතනය
- ස්වේච්ඡාවෙන් අපනයන සීමා පනවා ගැනීම
- විදේශ විනිමය පාලනය
- අපනයන හා ආනයන සීමා පැනවීම
- වෙළඳ සම්බාධක පැනවීම
- පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතියන් නියම කිරීම

# ආරක්ෂණයට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක

- ජාතික ආරක්ෂාව ස්ථාපිත වීම
- දේශීය කර්මාන්ත ආරක්ෂා වීම
- සේවා නියුක්තිය ආරක්ෂා වීම
- දේශීය ළදරු කර්මාන්ත ආරක්ෂා වීම
- අන්තර්ජාතික වෙළඳාමේ ඇතිවන උච්චාවචනයන් පාලනය කරගැනීමට හැකිවීම
- ප්‍රපාතනය වළක්වා ගැනීමට හැකි වීම
- ගෙවුම් ශේෂ දුෂ්කරතා වලට විසඳුම් සෙවීමේ දී උපකාරීවීම
- දේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීම සඳහා හැකිවීම
- භාණ්ඩ ආනයනය වැළැක්වීමේදී ආරක්ෂණය වැදගත් වීම

# ආරක්ෂණයට විපක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක

- ආරක්ෂණවාදී ප්‍රතිපත්ති මගින් අනුගමනය කිරීම නිසා දේශීය හා විදේශීය වෙළෙඳපොළ සංකෝචනය විය හැක
- විදේශ වෙළදාම සංකෝචනය වීම නිසා ජාතික ආදායම අඩුවීම
- දේශීය නිෂ්පාදන වල පිරිවැය අඩු කිරීමට සානුබල නොමැති නිසා අකාර්යක්ෂම කර්මාන්ත බිහිවීම
- ගුණාත්මක බවින් ඉහළ භාණ්ඩ නිෂ්පාදනය අඩුවිය හැකිය
- දියුණු තාක්ෂණය සංක්‍රමණයට බාධා ඇතිවිය හැකිය

# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 07

## අන්තර්ජාතික වෙළඳාම

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# වෙළෙඳ අනුපාතය

අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයකින් ලබාගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය වෙළෙඳ අනුපාතය ලෙස අර්ථ දැක්විය හැකිය.

වෙළඳ අනුපාතය ප්‍රභේද දෙකකි.

1. භාණ්ඩ වෙළඳ අනුපාතිකය

2. ආදායම් වෙළඳ අනුපාතිකය

# භාණ්ඩ වෙළඳ අනුපාතිකය

අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයකින් ලබාගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය භාණ්ඩ වෙළඳ අනුපාතය ලෙස අර්ථ දැක්විය හැකිය.

$$\text{භාණ්ඩ වෙළඳ අනුපාතිකය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

**2020** අපනයන මිල දර්ශකය **103.5**

**2020**ආනයන මිල දර්ශකය **108.4**

$$\text{භාණ්ඩ වෙළඳ අනුපාතිකය} = \frac{103.5}{108.4} \times 100$$

**95.47%**

උදා - භාණ්ඩ වෙළඳ අනුපාතිකය 25% කින් අඩු වූ අතර අපනයන මිල 20% කින් වැඩිවිය ආනයන මිලේ වෙනස කොපමණද?

$$\text{භාණ්ඩ වෙළඳ අනුපාතිකය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

$$75 = \frac{120}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

ආනයන මිල 160

60% කින් වැඩිවී ඇත

# භාණ්ඩ වෙළඳ අනුපාතිකය වෙනස්වීම කෙරෙහි බලපාන හේතු පහත සඳහන් පරිදි වෙන්කර දැක්විය හැකිය

## භාණ්ඩ වෙළඳ අනුපාතිකය අඩු වීම කෙරෙහි බලපාන හේතු

- අපනයන මිල දර්ශකය පහත වැටී ආනයන මිල දර්ශකය ඉහළ යාම
- ආනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් අපනයන මිල දර්ශකය පහළ බැසීම
- අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශකය ඉහළ යාම
- ආනයනික මිලදර්ශනය ස්ථාවරව තිබියදී අපනයන මිල දර්ශකය පහත වැටීම

## භාණ්ඩ වෙළඳ අනුපාතිකය වැඩි වීම කෙරෙහි බලපාන හේතු

- **අපනයන මිල දර්ශකය ඉහළ යාම හා ආනයන මිල දර්ශකය පහළ යාම**
- **අපනයන මිල දර්ශකය ට වඩා වැඩි වේගයකින් ආනයන මිල දර්ශකය පහත වැටීම**
- **අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශකය පහළ යාම**
- **ආනයන මිල දර්ශක ස්ථාවරව තිබියදී අපනයන මිල දර්ශකය ඉහල යාම**

# භාණ්ඩ වෙළඳ අනුපාතය වෙනස්වීම ආර්ථික ප්‍රතිවිපාක

## භාණ්ඩ වෙළඳ අනුපාතය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක

- අපනයන වල ආනයන සක්‍යතාවය ඉහල යාම
- වෙළඳ ශේෂය වාසිදායක වීම
- සමස්ත ශේෂය වාසිදායක වීම
- සංචිත වත්කම් ඉහළ යාම

## භාණ්ඩ වෙළඳ අනුපාතය පහළ යාම ආර්ථික ප්‍රතිවිපාක

- අපනයන හා ආනයන සක්‍යතාවය පහළයාම
- වෙළෙඳ ශේෂයේ හිඟය වැඩිවීම
- ගෙවුම් ශේෂයේ සමස්ත හිඟය වැඩිවීම
- සංචිත හා වත්කම් අඩුවීම

# ආදායම් වෙළඳ අනුපාතිකය

අපනයන ආදායමෙහි ආනයනය ක්‍රයශක්තිය මැනීම සඳහා භාවිතා කරන දර්ශකයයි.

ආදායම් වෙළඳ අනුපාතිකය මැනීම සඳහා පහත සඳහන් සූත්‍රය යොදා ගනී

$$\text{ආදායම් වෙළඳ අනුපාතිකය} = \frac{\text{අපනයන මිල දර්ශකය x අපනයන පරිමා දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$$

භාණ්ඩ වෙළඳ අනුපාතිකය අපනයන පරිමා දර්ශකයෙන් ගුණ කිරීමෙන් ආදායම් වෙළඳ අනුපාතිකය ලබාගත හැක

**2020** අපනයන මිල දර්ශකය **103.5**

**2020**ආනයන මිල දර්ශකය **108.4**

**2020** අපනයන පරිමා දර්ශකය **116.4**

$$\text{ආදායම් වෙළඳ අනුපාතිකය} = \frac{103.5 \times 116.4}{108.4} \times 100$$

**113.8**

## ආදායම් වෙළඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක

- අපනයන ඉපයුම් වැඩිවීම
- අපනයන ශක්‍යතාවය ඉහළ යාම
- වෙළඳ ශේෂය ඉහල යාම
- ගෙවුම් ශේෂය සමස්ත ශේෂය හිතකර තත්ත්වයකට පැමිණීම
- උද්ධමනාත්මක බලපෑම් ඇති කිරීම

## ආදායම් වෙළඳ අනුපාතිකය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක

- ආනයන වියදම් ඉහළයාම
- ආනයන ශක්‍යතාවය පහල යාම
- වෙළෙඳ ශේෂයේ පහළ යාම
- ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය අහිතකර තත්වයට පැමිනීම
- උද්ධමනත්මක බලපෑම් අඩු විය

# ආර්ථික විද්‍යාව

# 9 වන පාඩම - video 08

## අන්තර්ජාතික වෙළඳාම

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# ලෝක වෙළඳ සංවිධානය

බහු පාර්ශවීය වෙළඳාම ප්‍රවර්ධනයටත්, වෙළඳාම සුමටව සහ ක්‍රමවත්ව පවත්වාගෙන යාමටත් වෙළඳාම හා තීරුබදු පිළිබඳ පොදු සම්මුතිය වඩාත් ශක්තිමත් කරමින් 1995 දී පිහිටුවා ගනු ලැබූ ජාත්‍යන්තර සංවිධානයකි.

ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රධාන අරමුණු කිහිපයකි

- බහු පාර්ශවිය වෙළඳාම ප්‍රවර්ධනය කිරීම
- වෙළඳාම ක්‍රමවත්ව පවත්වාගෙන යාම
- වෙළඳ බාධක අවම කිරීම සහ වෙළෙඳ නීති සංශෝධනය කිරීම මඟින් ජාත්‍යන්තර වෙළඳ ක්‍රමය තුළ ප්‍රධාන ප්‍රතිසංස්කරණ ඇති කිරීම

# ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රධාන කාර්යයන් හයකි

- ලෝක වෙළඳ සංවිධානය යටතේ සාමාජික රටවල් අත්සන් කොට ඇති ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් නිසිලෙස ක්‍රියාත්මක වේද යන්න පරිපාලනය කිරීම.
- නිදහස් වෙළඳාම ප්‍රවර්ධනය කිරීමට අදාළ සාකච්ඡා සඳහා වේදිකාවක් සැපයීම.
- වෙළඳපොල ආරවුල් බේරුම් කිරීම.
- සාමාජික රටවල ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.
- තාක්ෂණික ආහාර හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සංවර්ධනය වන රටවලට වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ ගැටලු විසඳාගැනීමට ආධාර කිරීම ජාත්‍යන්තර ආර්ථික සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

# ගෝලීයකරණ යනු

ලෝකයේ රටවල් ආර්ථිකමය, සංස්කෘතිකමය හා දේශපාලන වශයෙන් විවිධ ප්‍රමාණයන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ප්‍රවණතාවයි.

ආර්ථික විද්‍යාවේ දී අවධානය යොමු කරනු ලබන්නේ ආර්ථික ගෝලීයකරණය කෙරෙහිය.

ආර්ථික ගෝලීයකරණය යනු ලෝකය රටවල් වෙළඳ, ප්‍රාග්ධන, මූල්‍ය, තාක්ෂණ ප්‍රතිපත්ති යනාදි විවිධ ප්‍රමාණයන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ක්‍රියාවලියයි.

වර්ථමානයේ ආර්ථික ගෝලීයකරණය තාක්ෂණය හා ප්‍රතිපත්ති මත ක්‍රියාත්මකවේ.

ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය අන්‍යෝන්‍ය රැඳියාව හා මූල්‍ය ප්‍රවහයන්ගේ වර්ධනය, නිෂ්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තරකරණය හා ජාත්‍යන්තර ශ්‍රම සංචලනය තීව්‍ර වේ.

# ගෝලීයකරණයට පක්ෂව තර්ක

- නිෂ්පාදන ක්‍රියාවලිය කේන්ද්‍රණය වීම නිසා නිෂ්පාදන හා පාරිභෝජන පර්යන්තයෙන් විතැන්වීම.
- නව අදහස් අත්දැකීම් ලැබීම.
- ලෝකයේ වෙළඳ පරිමාව ඉහළ යාම.
- ආර්ථික වෘද්ධි උපාය මාර්ගයක් ලෙස භාවිතා කිරීමට හැකිවීම.
- විදේශ ආයෝජන ඉහළ යාම.
- අමුද්‍රව්‍ය අඩුමිලට ආනයනය කළ හැකිවීම.
- විදේශ සේවා නියුක්තිය ඉහළ යාම.
- අධ්‍යාපනය හා දැනුම දියුණු වීම.
- නව රැකියා අවස්ථා බිහි වීම.
- විදේශ මුදල් ප්‍රේෂණ ඇතැම් රටවල ප්‍රධාන විනිමය ප්‍රවාහයක් බවට පත් වීම.
- ලෝකයේ හුදකලා රටවල් එම තත්ත්වයෙන් මිදී ජාත්‍යන්තර අර්ථ ක්‍රමය සමඟ ඒකාබද්ධ වීම.
- නව තාක්ෂණය ප්‍රසාරණය වීම.
- තරගකාරීත්වය නිසා ගුණාත්මක නිෂ්පාදන බිහිවීම.
- අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ලබාගත හැකිවීම

# ගෝලීයකරණයට විපක්ෂ තර්ක

- ගෝලීයකරණයේ ප්‍රතිලාභ ලෝකවාසී සියලු දෙනාට සාධාරණව බෙදී නොයාම.
- සංවර්ධිත රටවලට වැඩි ප්‍රතිලාභ හිමි වීම.
- ජාත්‍යන්තර වශයෙන් ආදායම් විෂමතා පුළුල්වීම.
- ගෝලීයකරණයේ අර්බුද අනෙක් රටවලට පහසුවෙන් ව්‍යාප්ත වීම.
- සමාජ ගැටුම් වර්ධනය වීම ජීවිතයේ අනාරක්ෂිත බවක් ඇති කිරීම.
- පාරිසරික ගැටලු ඇතිවීම සංස්කෘතික වෙනස්වීම ය වෙළඳපල අස්ථාවර ඇතිවීම නිසා ආර්ථික අර්බුද හට ගැනීම.
- දේශීය කර්මාන්ත බිඳ වැටීම හා රැකියා අහිමිවීම.
- ත්‍රස්තවාදය ව්‍යාප්ත වීම.
- සෞඛ්‍ය ගැටලු ඇති වීම.

# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 09

## අන්තර්ජාතික වෙළඳාම

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# ආර්ථික ඒකාබද්ධ වීම

විවිධ රටවල් අතර තීරු බදු හා තීරු බදු නොවන බාධකවලින් තොරව භාණ්ඩ සේවා සහ නිෂ්පාදන සාධක හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ආර්ථික ඒකාබද්ධ වීම ලෙස හඳුන්වයි.

ආර්ථිකය ඒකාබද්ධ වීම් වල විවිධ ස්වරූප පහත දැක්වේ

- වර්ණීය වෙළඳ කලාප.
- නිදහස් වෙළඳ කලාප.
- තීරු බදු සංගම්.
- පොදු වෙළඳපල.
- ආර්ථික හා මූල්‍ය සංගම්.
- පූර්ණ ආර්ථික ඒකාබද්ධ වීම.

# වර්ණීය වෙළඳ කලාප.

සමාජික නොවන රටවල් අතර වෙළඳාමේ දී භාවිතා කරන වෙළඳ සංරෝධක වලට වඩා අඩු සංරෝධක යටතේ සාමාජික රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරු කරගැනීම සඳහා රටවල් එකතු වී පිහිටුවා ගෙන ඇති සංවිධාන වරණීය වෙළඳ කලාප ලෙස හඳින්වේ.

මේ යටතේ ගිවිසුම්ගත රටවල් විසින් කලාපයේ අභ්‍යන්තර වෙළඳාම සඳහා එකඟතාවට බැඳුණු පොදු තීරු බදු වලින් කිසියම් ප්‍රතිශතයක් කපා හරිනු ලබයි.

- යුරෝපා ආර්ථික කලාපීය ගිවිසුම්(EEAA)
- උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම්(NAFTA)

# නිදහස් වෙළඳ කලාප

සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමඟ වෙළඳාමේ යෙදෙන විට එම රටවල අභිමතය පරිදි වෙළඳ සංරෝධක පවත්වාගෙන යාමටත් සාමාජික රටවල් අතර වෙළඳාම සංරෝදක වලින් තොරව පවත්වාගෙන යාමටත් රටවල් කිහිපයක් එකතුවී ඇති කරගන්නා සංවිධාන නිදහස් වෙළඳ කලාප වේ.

මෙහි දී ගිවිසුම්ගත රටවල් විසින් එකඟ වූ තීරු බදු කාණ්ඩවලට අයත් තීරුබදු මුළුමනින්ම ඉවත් කෙරේ.

- අප්‍රිකානු නිදහස් වෙළෙඳ කලාපය.**(AFTZ)**
- ආසියානු පැසිෆික් නිදහස් වෙළෙඳ කලාපය.**(AFFTZ)**
- මධ්‍යම යුරෝපා නිදහස් වෙළඳ කලාප.**(MEFTZ)**
- උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ කලාපය.**(NAFTZ)**

# තීරු බදු සංගම්

සාමාජික රටවල් අතර වෙළදාම වෙළඳ සංරෝධක වලින් තොරව පවත්වාගෙන යාම සඳහා සාමාජික සහ සාමාජික නොවන රටවල් අතර එක සමාන වෙළෙඳ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම සඳහා රටවල් කිහිපයක් එකතුවී ඇති කරගන්නා සංගම් තීරුබදු සංගම් නමින් හැඳින්වේ.

මෙහිදී ගිවිසුම්ගත භාණ්ඩ වලට අදාළ වෙනත් රටවලින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා සමාන තීරු බදු ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර ගිවිසුම්ගත භාණ්ඩ සඳහා සංගමයේ සාමාජිකත්වය දරණ රටවල තීරු බදු මුළුමනින්ම ඉවත් කෙරේ.

- මධ්‍යම ඇමරිකානු පොදු වෙළඳ පොළ(**CACM**)
- කැරිබියානු ප්‍රජාව(**CARICOM**)
- උතුරු ඇමරිකානු ප්‍රජාව(**NAC**)
- දකුණු අප්‍රිකානු තීරුබදු සංගමය(**SACU**)

# පොදු වෙළඳපල

සාමාජික රටවල් අතර භාණ්ඩ හා සේවා වෙළඳාම සංරෝදක වලින් තොරව පවත්වාගෙන යාමටත් සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමග වෙළඳාම පවත්වාගෙන යාමේදී පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට සාමාජික රටවල් අතර නිෂ්පාදන සාධක නිදහසේ සංචලනය කිරීමටත් රටවල් ඒකාබද්ධ වීම පොදු වෙළෙඳපොළ නමින් හැඳින්වෙයි.

ශ්‍රමය හා ප්‍රාග්ධන වැනි නිෂ්පාදන සාධක හා භාණ්ඩ හා සේවා ගිවිසුම් ගත රටවල් අතර බාධකයකින් තොරව සංචලනය කිරීමේ හැකියාවක් ලැබේ.

- කැරිබියන් කොමියුනිටි පොදු වෙළඳපොල
- මධ්‍යම ඇමරිකානු පොදු වෙළඳපොළ
- මධ්‍යම ඇමරිකානු ආර්ථික හා මූල්‍ය සංගමය

# ආර්ථික හා මූල්‍ය සංගම්

සාමාජික රටවල් අතර වෙළඳාම සංරෝදක වලින් තොරව පවත්වාගෙන යාමට සාමාජික හා සාමාජික නොවන රටවල් අතර භාණ්ඩ හා සේවා වෙළඳාම පොදු ප්‍රතිපත්තියක් යටතේ පවත්වාගෙන යාමටත් සාමාජික රටවල් අතර ශ්‍රමය හා ප්‍රාග්ධනය නිදහසේ සංචලනය කිරීමටත් සාමාජික රටවල් අතර එක හා සමාන මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමටත් රටවල් කිහිපයක් එකතුව පිහිටුවාගන්නා සංගම් ආර්ථික හා මූල්‍ය සංගම් යනුවෙන් හැඳින්වේ.

- මධ්‍යම අප්‍රිකානු ආර්ථික හා මූල්‍ය සංගමය(**CEMAC**)
- බටහිර අප්‍රිකානු ආර්ථික හා මූල්‍ය සංගමය(**ECOWAS**)
- යුරෝපා මූල්‍ය හා ආර්ථික සංගමය(**EMU**)

# පූර්ණ ආර්ථික ඒකාබද්ධ වීම

සාමාජික හා සාමාජික නොවන රටවල් අතර භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සාධක හුමාරු කිරීමේ දී සංරෝදක වලින් තොරව කටයුතු කිරීම සඳහා සාමාජික රටවල් අතර රේඛීය මූල්‍ය ප්‍රතිපත්තියක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණ හා දේශපාලන ප්‍රතිපත්ති පවත්වාගෙන යාම සඳහාත් ලෝකයේ රටවල් එකතු වීම පූර්ණ එකාබද්දවීම් ලෙස හැඳින්වේ.

ආර්ථික ඒකාබද්ධවීම් සඳහා අත්සන් කරනු ලබන ගිවිසුම වර්ග දෙකකට බෙදිය හැකි.

1. ද්වි පාර්ශවීය වෙළෙඳ ගිවිසුම්

2. බහු පාර්ශවීය වෙළෙඳ ගිවිසුම්

වෙළඳාම හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් රටවල් දෙක අතර ඇති කර ගන්නා වෙළඳ ගිවිසුම් ද්වි පාර්ශවීය වෙළෙඳ ගිවිසුම් ලෙස හැඳින්වේ.
වර්තමානයේ දී ශ්‍රී ලංකාව ඇතුලත් ද්විපාර්ශවික වෙළඳ ගිවිසුම පහත දැක්වේ.

1. ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම(ISFTA)
2. පාකිස්ථාන ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම(PSFTA)

වෙළඳාම හා මූල්‍ය සම්බන්ධයෙන් රටවල් කිහිපයක් අතර ඇති කරගන්නා වෙළෙඳ ගිවිසුම බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් වේ.
ශ්‍රී ලංකාව ඇතුළත් වී සිටින බහුපාර්ශව වෙළෙඳ ගිවිසුම්

1. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම(SAFTA)

# විදේශ වෙළඳ ගිවිසුම්වල ඇති වැදගත් කම් පහත දැක්වේ

- රටවල් අතර සහයෝගීතාව වර්ධනය වීම.
- වෙළෙඳපොළ පුළුල් වීම.
- ප්‍රවාහණ පිරිවෙන අඩුවීම.
- දේශීය වෙළෙඳපොළ මිල ගණන් පහළ යාම.
- විදේශ ආයෝජන ප්‍රවර්ධනය වීම.
- නව කාර්මික භාණ්ඩ අඩු මිලට ලබා ගත හැකිවීම.
- සේවා නියුක්තිය ඉහළ යාම.
- අමුද්‍රව්‍ය මිල පහළ යාම.
- අපනයන විවිධාංගීකරණය ට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් වීම.

# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 10

### අන්තර්ජාතික වෙළඳාම

### අපනයන ව්‍යුහය

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# අපනයන වෙළඳාමයි

කිසියම් රටක් ලෝකයේ වෙනත් රටවලට භාණ්ඩ හා සේවා අලෙවි කිරීම අපනයන වෙළඳාමයි.

උදා - ශ්‍රී ලංකාව ඇමරිකානු එක්සත් ජනපදයට තේ අලෙවි කිරීම

ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය

- කෘෂිකාර්මික අපනයන
- කාර්මික අපනයන
- ඛනිජ ද්‍රව්‍ය අපනයන
- වර්ග නොකළ අපනයන

# ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පහත පරිදි ප්‍රතිශතාත්මකව දැක්වියහැකිය

5.3 සංඛ්‍යා සටහන


අපනයන සංයුතිය

| කාණ්ඩය | 2017 | | 2018 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,767.2** | **24.4** | **2,579.3** | **21.7** | **-187.9** | **-6.8** | **-35.5** |
| තේ | 1,529.8 | 13.5 | 1,428.5 | 12.0 | -101.3 | -6.6 | -19.1 |
| රබර් | 38.9 | 0.3 | 31.6 | 0.3 | -7.3 | -18.8 | -1.4 |
| පොල් | 347.9 | 3.1 | 311.0 | 2.6 | -36.9 | -10.6 | -7.0 |
| කුළුබඩු | 406.2 | 3.6 | 360.2 | 3.0 | -46.0 | -11.3 | -8.7 |
| එළවළු | 28.5 | 0.3 | 28.2 | 0.2 | -0.2 | -0.8 | ... |
| සකස් නොකළ දුම්කොළ | 36.5 | 0.3 | 35.6 | 0.3 | -0.9 | -2.5 | -0.2 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 138.7 | 1.2 | 118.4 | 1.0 | -20.3 | -14.7 | -3.8 |
| මුහුදු ආහාර | 240.6 | 2.1 | 265.8 | 2.2 | 25.2 | 10.5 | 4.8 |
| **කාර්මික අපනයන** | **8,541.9** | **75.2** | **9,258.2** | **77.9** | **716.2** | **8.4** | **135.3** |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,031.9 | 44.3 | 5,317.7 | 44.7 | 285.7 | 5.7 | 54.0 |
| රබර් නිෂ්පාදිත | 835.4 | 7.4 | 875.3 | 7.4 | 39.9 | 4.8 | 7.5 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 434.3 | 3.8 | 622.1 | 5.2 | 187.8 | 43.2 | 35.5 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 257.5 | 2.3 | 278.0 | 2.3 | 20.5 | 8.0 | 3.9 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 392.7 | 3.5 | 462.3 | 3.9 | 69.6 | 17.7 | 13.2 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 370.8 | 3.3 | 434.8 | 3.7 | 64.0 | 17.3 | 12.1 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 48.8 | 0.4 | 31.7 | 0.3 | -17.2 | -35.2 | -3.2 |
| ප්‍රවාහන උපකරණ | 162.3 | 1.4 | 120.3 | 1.0 | -42.0 | -25.9 | -7.9 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 158.4 | 1.4 | 147.7 | 1.2 | -10.7 | -6.8 | -2.0 |
| පිගන් මැටි නිෂ්පාදිත | 33.7 | 0.3 | 31.3 | 0.3 | -2.5 | -7.3 | -0.5 |
| අනෙකුත් කාර්මික අපනයන | 816.1 | 7.2 | 937.1 | 7.9 | 121.1 | 14.8 | 22.9 |
| **ඛනිජමය අපනයන** | **34.5** | **0.3** | **34.4** | **0.3** | **-0.1** | **-0.4** | **...** |
| **වර්ග නොකළ අපනයන** | **16.9** | **0.1** | **17.8** | **0.1** | **1.0** | **5.8** | **0.2** |
| **මුළු අපනයන (ආ) (ඇ)** | **11,360.4** | **100.0** | **11,889.6** | **100.0** | **529.2** | **4.7** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)** | **152.46** | | **162.54** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රති අපනයන ඇතුළත් නොවේ.
(ඇ) ගලපන ලද
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# අපනයන සංයුතිය


අපනයන සංයුතිය - 2018
ඛනිජ සහ වෙනත් 0.4%
රෙදිපිළි හා ඇඟලුම් 44.7%
රබර් නිෂ්පාදිත 7.4%
ඛනිජ තෙල් නිෂ්පාදිත 5.2%
ආහාර, පාන වර්ග හා දුම්කොළ 3.9%
යන්ත්‍ර හා යාන්ත්‍රික උපකරණ 3.7%
මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ 2.3%
සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් 1.2%
ප්‍රවාහන උපකරණ 1.0%
වෙනත් 8.4%
කෘෂිකාර්මික 21.7%
කාර්මික 77.9%
මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# 1977 න් පසු අපනයන ව්‍යුහය වෙනස්වීම්

| | 1977 | 2018 |
|---|---|---|
| කෘෂිකාර්මික | 79% | 21.7% |
| කාර්මික | 14% | 77.9% |
| වෙනත් | 7% | 0.4% |
| මුළු | 100% | 100% |

# අපනයන වෙළඳාමේ දී මුහුණ දෙන ගැටලු

- අපනයන බෝගවල මිල උච්චාවචනය වීම.
- අපනයන පරිමාව අඩු වීම.
- ලෝක වෙළඳපලේ ඇති දැඩි අවිනිශ්චිතතාවය.
- ගෝලීය ආර්ථික අවපාතය.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳ පොළවල් වර්ධනය මන්දගාමී වීම.

# අපනයන ගැටළුවලට විසඳුම් ලෙස ඉදිරිපත් කළ හැකි කරුණු

- ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර ඇති සම්බන්ධය වැඩි දියුණු කිරීම.
- විදේශ වෙළෙඳ පොළවල සිදුවන අලෙවිකරණය හා ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන ඉහළ නැංවීම.
- වෙළෙඳ ගිවිසුම් ඵලදායි ලෙස ලෙස ශක්තිමත් කිරීම.
- නව අපනයන වෙළඳ පොළවල් ආරක්ෂා කර ගැනීමට හා දැනට පවතින වෙළඳපොල පුළුල් කිරීම හා භාණ්ඩ විවිධාංගීකරණය කිරීම.
- අපනයන කෙරෙහි යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ආයතන ස්ථාපිත කිරීම.
- අපනයන සංවර්ධනය සඳහා කවුන්සලයක් පිහිටුවීම.

# ආර්ථික විද්‍යාව

## 9 වන පාඩම - video 11

## අන්තර්ජාතික වෙළඳාම

## ආනයන ව්‍යුහය

දේශක - කුෂාන් වීරහැන්නැදිගේ
BA (sp) Economics (SUSL)

# ආනයන වෙළඳාමයි

යම් රටක් ලෝකයේ වෙනත් රටවල භාණ්ඩ හා සේවා මිලදී ගැනීම ආනයන වෙළඳාමයි

උදා - ශ්‍රී ලංකාව ජපානයෙන් වාහන මිලදී ගැනීම

ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය


- පාරිභෝජන භාණ්ඩ
- අන්තර් භාණ්ඩ
- ආයෝජන භාණ්ඩ
- වර්ග නොකළ භාණ්ඩ

# ශ්‍රී ලංකාවේ අනයන ව්‍යුහය පහත පරිදි ප්‍රතිශතාත්මකව දැක්වියහැකිය

ආනයන සංයුතිය

| කාණ්ඩය | 2017 | | 2018 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,502.5** | **21.5** | **4,979.7** | **22.4** | **477.1** | **10.6** | **38.1** |
| ආහාර හා පාන වර්ග | 1,841.1 | 8.8 | 1,606.1 | 7.2 | -235.0 | -12.8 | -18.8 |
| සහල් | 300.9 | 1.4 | 106.8 | 0.5 | -194.1 | -64.5 | -15.5 |
| සීනි හා රසකැවිලි | 258.0 | 1.2 | 249.7 | 1.1 | -8.3 | -3.2 | -0.7 |
| කිරි නිෂ්පාදිත | 315.8 | 1.5 | 332.3 | 1.5 | 16.5 | 5.2 | 1.3 |
| පරිප්පු | 114.4 | 0.5 | 78.6 | 0.4 | -35.8 | -31.3 | -2.9 |
| වෙනත් | 851.9 | 4.1 | 838.7 | 3.8 | -13.2 | -1.5 | -1.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 2,661.5 | 12.7 | 3,373.6 | 15.2 | 712.1 | 26.8 | 56.8 |
| රථවාහන | 772.7 | 3.7 | 1,573.5 | 7.1 | 800.8 | 103.6 | 63.9 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 520.0 | 2.5 | 532.0 | 2.4 | 12.0 | 2.3 | 1.0 |
| ගෘහ උපකරණ | 258.2 | 1.2 | 232.2 | 1.0 | -25.9 | -10.1 | -2.1 |
| රෙදිපිළි හා උපාංග | 369.0 | 1.8 | 310.3 | 1.4 | -58.8 | -15.9 | -4.7 |
| වෙනත් | 741.6 | 3.5 | 725.6 | 3.3 | -16.0 | -2.2 | -1.3 |
| **අතරමැදි භාණ්ඩ** | **11,435.8** | **54.5** | **12,488.0** | **56.2** | **1,052.3** | **9.2** | **84.0** |
| ඉන්ධන | 3,427.9 | 16.3 | 4,151.9 | 18.7 | 724.0 | 21.1 | 57.8 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,724.2 | 13.0 | 2,858.5 | 12.9 | 134.3 | 4.9 | 10.7 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ | 772.4 | 3.7 | 572.7 | 2.6 | -199.7 | -25.9 | -15.9 |
| රසායනික නිෂ්පාදිත | 834.5 | 4.0 | 904.2 | 4.1 | 69.7 | 8.4 | 5.6 |
| තිරිඟු හා ඉරිඟු | 356.6 | 1.7 | 373.5 | 1.7 | 16.9 | 4.7 | 1.3 |
| පොහොර | 102.8 | 0.5 | 261.6 | 1.2 | 158.8 | 154.4 | 12.7 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 3,217.3 | 15.3 | 3,365.6 | 15.1 | 148.3 | 4.6 | 11.8 |
| **ආයෝජන භාණ්ඩ** | **4,894.7** | **23.3** | **4,690.4** | **21.1** | **-204.3** | **- 4.2** | **-16.3** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,591.4 | 7.6 | 1,524.5 | 6.9 | - 66.8 | - 4.2 | - 5.3 |
| ප්‍රවාහන උපකරණ | 674.9 | 3.2 | 668.1 | 3.0 | - 6.8 | -1.0 | -0.5 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,620.6 | 12.5 | 2,491.6 | 11.2 | -129.0 | - 4.9 | -10.3 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 7.8 | ... | 6.1 | ... | -1.7 | -22.4 | -0.1 |
| **වර්ග නොකළ ආනයන** | **146.8** | **0.7** | **74.6** | **0.3** | **-72.1** | **- 49.1** | **-5.8** |
| **මුළු ආනයන (ආ) (ඇ)** | **20,979.8** | **100.0** | **22,232.7** | **100.0** | **1,252.9** | **6.0** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)** | **152.46** | | **162.54** | | | | |

# ආනයන සංයුතිය


ආනයන සංයුතිය - 2018
ආයෝජන භාණ්ඩ 21.1%
රෙදිපිළි හා රෙදිපිළි උපාංග 12.9%
රසායනික නිෂ්පාදිත 4.1%
වෙනත් 0.3%
පාරිභෝගික භාණ්ඩ 22.4%
අතරමැදි භාණ්ඩ 56.2%
මූල ලෝහ 3.1%
පිරිපහදු කළ ඛනිජ තෙල් 13.2%
වෙනත් 13.5%
රත්‍රන් 2.0%
බොරතෙල් 4.4%
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත 3.1%
මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# 1977 න් පසු ආනයන ව්‍යුහය වෙනස්වීම්

| | 1977 | 2018 |
|---|---|---|
| පාරිභෝජන භාණ්ඩ | 42% | 22.4% |
| අන්තර් භාණ්ඩ | 45% | 56.2% |
| ආයෝජන භාණ්ඩ | 12% | 21.1% |
| වෙනත් | 1% | 0.3% |
| මුළු | 100% | 100% |

# ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳව

- ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳව ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර ඇති සබඳතා වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු වූ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
- විදේශීය වෙළෙඳ ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම සඳහා රජය පුළුල් ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් යෝජනා කරන ලදී.
- වෙළඳාම තීරණය වන නීති රීති රෙගුලාසි වෙනස් කිරීමට ප්‍රයත්න දැරීම.
- වෙළෙඳ ගිවිසුම් ඇති කිරීම මගින් විදේශ වෙළඳපල වෙත ශක්තිමත් ප්‍රවේශයක් ඇති කිරීම.
- උපාය මාර්ගයක වෙළඳ ප්‍රවර්ධනය.
- වෙළඳ තීරුබදු ප්‍රතිපත්ති තවදුරටත් තාර්කීකරණය.
- නොබැඳි විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අපනයන ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
- ආනයන තාර්කීකරණය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම.
- ආයෝජන ප්‍රවර්ධනය සඳහා උපකාරී වන ද්වි පාර්ශවීය ගිවිසුම් වලට එළඹීම.
- ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන බහුපාර්ශවීය ක්‍රියාමාර්ග සඳහා අඛණ්ඩව සම්බන්ධ වීම.

# ශ්‍රී ලංකාවේ වෙළඳ දිශාව

